／

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1871/19 - 2014 ජූලි මස 15 වැනි අඟහරුවාදා - 2014.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංක* : EHE/DS/LND/03/ACQ/UDA/01.

*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය:* 4/3/10/2011/UDA/318.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමු.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර:*

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ පල්ලේ පත්තුවේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුමත්ත ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අවසාන ගම් පිඹුරු අංක 665හි අතිරේක අංකය 4 පත්‍ර අංක 4 හා 2014.03.18 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 43 වශයෙන් පෙන්නුම් කර ඇති ආදාවන්වෙලියාය නමැති පාලු වූ කුඹුරු ඉඩමෙන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.7060ක් පමණ වූ 22 වැනි බිම් කැබැල්ලේ කොටසක්.

මායිම් :-

උතුර: මාර්ග (ප්‍රා.ස.); නැගෙනහිර: කැබලි අංක 26; දකුණ: කැබලි අංක 26 හා 27; බටහිර: කැබලි අංක 27 හා මාර්ග (ප්‍රා.ස.)

මුල් හිමිකම කියන අය: රජමහා විහාර මාවත, මෝරගල ඇහැලියගොඩ පදිංචි ආර්. එල්. තිලකරත්න, උඩුමත්ත ඇහැලියගොඩ පදිංචි ආර්. ජී. සිසිර කුමාර, පනාවල පාර, ඇහැලියගොඩ පදිංචි ජේ. විජේසිංහ සහ තවත් අය.

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ පල්ලේ පත්තුවේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 136බී විලේගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොට්ටගස්වත්ත ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අවසාන ගම් පිඹුරු අංක 667හි අතිරේක අංකය 3 පත්‍ර අංකය 4 හා 2014.03.18 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 49 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.2112ක් පමණ වූ මුතුවලේ කුඹුර, උස්දුරාගෙගරුඩ කුඹුර යන පාලු වූ කුඹුරු ඉඩම්වලින් අංක 21 සහ 48 වැනි බිම් කැබලිවල කොටසක්.

මායිම් :-

උතුර: කැබලි අංක 22, 2 හා 21; නැගෙනහිර: කැබලි අංක 2, 21, 48 සහ අ.ග.පි. 674; දකුණ: කැබලි අංක 21, අ.ග.පි. 674 සහ කැබලි අංක 22; බටහිර: අ.ග.පි. 674 සහ කැබලි අංක 22.

මුල් හිමිකම කියන අය: රජමහා විහාර මාවත, මෝරගල ඇහැලියගොඩ පදිංචි ආර්. එල්. තිලකරත්න, උඩුමත්ත ඇහැලියගොඩ පදිංචි ආර්. ජී. සිසිර කුමාර, පනාවල පාර, ඇහැලියගොඩ පදිංචි ජේ. විජේසිංහ සහ තවත් අය.

3. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ පල්ලේ පත්තුවේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 136ඩී මෝරගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මෝරගල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අවසාන ගම් පිඹුරු අංක 668හි අතිරේක අංකය 11 පත්‍ර අංක 11 හා 2014.03.18 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 97 වශයෙන් පෙන්නුම් කර ඇති හුලවල්ගෙවත්ත, බණ්ඩාර කුඹුර, උඩුහවෙල, වලේලියද්ද, කොරවක්මුල්ලේ කුඹුර නමැති පාලු වූ කුඹුරු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 9.8950ක අංක 86, 87 බිම් කැබලි සහ 42 සහ 7 වැනි බිම් කැබලිවල කොටස්.

මායිම් :-

උතුර: මාර්ග (ප්‍රා.ස.) සහ කැබලි අංක 4; නැගෙනහිර: කැබලි අංක 4; දකුණ: කැබලි අංක 4, 78, 45, 44, 43, 42, 41 සහ 7; බටහිර: කැබලි අංක 41, 42 සහ 7.

මුල් හිමිකම කියන අය: රජමහා විහාර මාවත, මෝරගල ඇහැලියගොඩ පදිංචි ආර්. එල්. තිලකරත්න, උඩුමත්ත ඇහැලියගොඩ පදිංචි ආර්. ජී. සිසිර කුමාර, පනාවල පාර, ඇහැලියගොඩ පදිංචි ජේ. විජේසිංහ සහ තවත් අය.

1A - PG 2107 - 100 - (2014/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ පල්ලේ පත්තුවේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 136 කැන්දන්ගමුව ඉහලගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කැන්දන්ගමුව ඉහලගම ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අවසාන ගම් පිඹුරු අංක 674හි අතිරේක අංකය 9 පත්‍ර අංක 11 හා 2014.03.18 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 119 වශයෙන් පෙන්නුම් කර ඇති උතුරගේගරුඩ කුඹුර, පිංකුඹුර මැදවෙල්යාය නමැති පාලු වූ කුඹුරු වලින් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.9292ක ප්‍රමාණය අංක 2 බිම් කැබල්ලේ කොටසක්.

මායිම් :-

උතුර: කැබලි අංක 1 සහ අ.ග.පි. 667; නැගෙනහිර: කැබලි අංක 2, 3 හා අ.ග.පි. 691; දකුණ: අ.ග.පි. 691, කැබලි අංක 55, 104, 103 සහ 1; බටහිර: කැබලි අංක 55 සහ 1.

මුල් හිමිකම් කියන අය: රජමහා විහාර මාවත, මෝරගල ඇහැලියගොඩ පදිංචි ආර්. එල්. තිලකරත්න, උඩුමත්ත ඇහැලියගොඩ පදිංචි ආර්. ජී. සිසිර කුමාර, පනාවල පාර, ඇහැලියගොඩ පදිංචි ජේ. විජේසිංහ සහ තවත් අය.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 28 වැනි දින පූ. භා.10.00ට ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2014 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී *ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ආර්. එච්. එස්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ඇහැලියගොඩ.

2014 ජූලි මස 07 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 55

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.